# අගාධය තුළට

**ආර්ථික යුක්තිය වෙනුවෙන් ස්ත්‍රීවාදී එකමුතුව**
***2024 වෙනුවෙන් අයවැය පිළිබඳ ප්‍රකාශය***

වික්‍රමසිංහ - රාජපක්ෂ ආණ්ඩුව විසින් 2024 වෙනුවෙන් අයවැය නොවැම්බර් මසදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.යෝජිත අයවැය ජනතාවගේ ජීවත හා අනාගතය විපතට හෙලයි, ජාතික හා ජාත්‍යන්තර විශේෂඥයන්ගේ අනතුරු ඇඟවීම් නොසලකා හරියි, එමෙන්ම තිරසාර නොවන ආකාරයෙන් මෙරට කාන්තාවන් හා වැඩ කරන ජනතාව මත තව දුරටත් බර පටවයි.

කිසිදු සුජාතභාවයක් නොමැති හා ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන ලද රජයක් එළඹෙන වසර තුළ නව නීති හා සංශෝධන 60 ක් බලාත්මක කෙරෙනු ඇති බව අයවැය කථාව තුළ ප්‍රකාශ කරනු අසා අපි තැති ගෙන සිටින්නෙමු.ඊළඟ මැතිවරණයට පෙර රට විකුණා දැමීම හා ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කර දැමීම වෙනුවෙන් නෛතික රාමුව සකස් කිරීමට ආණ්ඩුව සැලසුම් කරන බව පැහැදිලිය.තවද, ජා.මූ.අ. සිදු කිරීමට බලකරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වෙනුවෙන් අයවැය සහාය, සමාජ වියදම් මත දැඩි පිළිවෙත, බලයේ සිටින්නන්ගේ නරක ආර්ථික ප්‍රතිපත්ති සහ පාලනය හේතුවෙන් ඇති වූ විදේශ ණය ගෙවීම පිණිස වඩාත්ම අවදානමට පත්විය හැකි පිරිස් වෙතින් මුදල් ඇද ගැනීම, ශ්‍රී ලංකාව අගාධයට තල්ලු කරනු ඇත.

විශේෂඥ උපදෙස් පසෙක තබා ආණ්ඩුව වක්‍ර බදු හරහා ආදායම වැඩි කර ගැනීම කෙරේ දැඩි බලාපොරොත්තු තබාගෙන සිටින බව පෙනී යන අතර එමගින් දුප්පතුන් මත බර තවදුරටත් වැඩි වනු ඇත. ප්‍රාග්ධන ලාභ බද්ද වැනි සියළු ප්‍රගතිශීලී බදුවල සියයට 25 ක වැඩි වීමට එරෙහිව මෙම අයවැය සෑම පාරිභෝගිකයෙකුට පහර වදින එකතු කළ අගය මත බදු ආදායමේ සියයට 107 ක වැඩි වීමක් ඉලක්ක කරයි. මෙබඳු වක්‍ර බදු ඉලක්ක ඉදිරිපත් කෙරෙන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිළ දිගින් දිගටම ඉහළ මට්ටමක පවතින හා උපයෝගීතා මත ගාස්තු ඉහළ නැංවීම් කුටුම්භ සිය දහස් ගණනකට ඉන්ධන, විදුලිය හා ජලය කරා ප්‍රවේශය නොමැති තත්ත්වයකට පත් කරනු ලැබ ඇති කාලවකවානුවක් තුළ වේ.මේ අතරතුර, ආණ්ඩුව මෙතෙක් ධන බද්දක් ප්‍රකාශයට පත් කර නොතිබීම හේතුවෙන් ධනවතුන්ට ධනය රැස් කිරීමට, ආරක්ෂා කරගැනීමට හා ප්‍රදර්ශනය කිරීමට ඉඩ සැලසී ඇත.

වියදම් පක්ෂයෙන්, අයවැයෙන් සැලකිය යුතු කුට්ටියක් (ද.දේ.නි.යෙන් සියයට 8.4 ක්) එනම් පුනරාවර්තන වියදමෙන් අඩක්, ආණ්ඩුවේ ණය මත පොලිය ආපසු ගෙවීමට වැය කෙරෙනු ඇති බව අපි දකින්නෙමු.අපේ සමාජයේ යහපැවැත්මට තීරණාත්මක වන අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි අත්‍යවශ්‍ය සේවා ඇතුළුව රාජ්‍ය අංශය නඩත්තුව වෙනුවෙන් කිසි සේත් සතුටු විය නොහැකි මුදල් ප්‍රමාණ වෙන් කර තිබේ.කොවිඩ් 19 ගෝලීය වසංගතය සහ කලින් පැවැති ආණ්ඩු සෞඛ්‍ය අංශය නිසි ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන් විශේෂයෙන්ම සෞඛ්‍ය අංශය දැඩි ප්‍රහාරයකට ලක්ව ඇත.පුහුණු වෘත්තිකයන් සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශය තුළ පවතින අර්බුදයට විසඳුම් සැපයීමට අයවැය කටයුතු නොකරන අතර ඔවුන් රට තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැඳී සිටීමට ආධාරක වන හා එය සහතික කරන ප්‍රතිපත්තිමය මැදිහත් වීම් කිසිවක් නැත.ඒ වෙනුවට විශේෂඥ වෛද්‍යවරුන් 274 ක් ඇතුළුව වෛද්‍ය වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් රටින් නික්ම යාමක් අප දැක ඇත.වෛද්‍ය කාර්ය මණ්ඩලය නොමැති කමින් රටේ රජයේ රෝහල් 40 ක් වැසී ගොස් ඇති අතර තවත් 100 ක් වැසී යාමට ආසන්නව පවතින බව සෞඛ්‍ය අමාත්‍යවරයා මේ සතියේ හෙළි කළේය.

ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන ජයග්‍රහණ අත්කර ගැනීමට පදනම වූ හා කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කළ නිදහස් සෞඛ්‍යය හා නිදහස් අධ්‍යාපනය බිඳ දැමීමට නිදහසට කරුණක් ලෙස ආණ්ඩුව ආර්ථික අර්බුදය යොදා ගනිමින් සිටී.මෙම අංශ වාණිජකරණයට මග පාදනු ඇති අයවැය යෝජනා එය ඉදිරිපත් කර ඇත.ජනාධිපතිවරයා නව විශ්වවිද්‍යාල ගණනාවක් හඳුන්වාදීම සහ පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිගැනීම ප්‍රකාශයට පත්කර තිබියදී රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය බිඳ වැටීමට ආසන්නව පවතී.

ශ්‍රී ලංකාව දැනටමත් අධ්‍යාපනය වෙනුවෙන් දකුණු ආසියාවේ අඩුම රාජ්‍ය මුදල් වැය කිරීම සිදු කරයි.පසුගිය වසර පහ තුළ අධ්‍යාපනය සහ සෞඛ්‍යය තුළ ආයෝජන එක තැන පල්වෙමින් පැවතිණි. 2023 සහ 2024 වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම 2022 වියදමෙන් වෙනස් නොවේ (ද.දේ.නි.යෙන් 2% ට අඩු). මෙම සන්දර්භය තුළ, රජයේ විශ්වවිද්‍යාල වලට රජයේ මූල්‍ය සහායෙන් තොරව පවතින තත්තවයට පැමිණීමට බලපෑම් කරන අතරම බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කරන ලෙසද ඉල්ලීම රටේ නිදහස් උසස් අධ්‍යාපනයේ බිඳ වැටීමට මග පාදනු ඇත.තවද, සිසුන්ට ණය යෝජනා ක්‍රම ලබා දීම සඳහා වන රජයේ යෝජනාව නව උගත් තරුණ පරම්පරාව අතර ණයගැතිබව නිර්මාණය කර කුටුම්භ ණය බර වැඩි කරවනු ඇත. 2024 අයවැය රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ සම්පත් නොමැතිකම තවදුරටත් උග්‍ර කරවන බැවින්, කොවිඩ් 19 ගෝලීය වසංගතයේ සහ දැනට පවතින අර්බුදයේ පිරිවැය දැරීමට සිදු වූ සමස්ත තරුණ පරම්පරාවක් තවදුරටත් ජීවන අවස්ථා අහිමි කරනු ලැබීමට පත්වෙයි.

දැනට තෝරාගත් ප්‍රාථමික පාසල් කිහිපයකට පමණක් ආණ්ඩුව දිවා ආහාරය සපයයි.ඉතා දුෂ්කර හා දිළිඳු ප්‍රදේශවල පිහිටි පාසල්ද ඇතුළුව ප්‍රාථමික පාසල් විශාල සංඛ්‍යාවකට දිවා ආහාර වැඩසටහන වෙනුවෙන් ආණ්ඩුවේ කිසිදු සහායක් නොලැබේ.ආහාර වේලකට වෙන් කෙරෙන මුදල දෛනික පදනමින් පෝෂ්‍යදායක ආහාරයක් සැපයීමට ප්‍රමාණවත් නැත.තවද, ද්විතීයික පාසල්වල සිසුන් වෙනුවෙන් ආහාර වේල් සැපයීමට ප්‍රතිපත්තියක් නොමැති අතර මේ තත්ත්වය සිසුන් සා/පෙළට ළඟා වීමට පෙර පාසලෙන් ගිලිහී යන අවස්ථා වැඩි කරවයි.ඒ වෙනුවට සෞඛ්‍යය කරා නොමිලේ ප්‍රවේශය තිබෙන රටක් තුළ ගැටළු සහගත හා අනවශ්‍ය සුරක්ෂා සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් රු.මිලියන 200 ක් වෙන් කිරීමට ආණ්ඩුව යෝජනා කර තිබේ. සියළු පාසල්වල සියළු ළමුන් වෙනුවෙන් දිවා ආහාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාවක් පවතින බවත්, ප්‍රමුඛතාවක් ලෙස තිබෙන අරමුදල් එයට යොමු කරනු ලැබිය යුතු බවත් අපි යළි අවධාරණය කරන්නෙමු. ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතික සහ අධ්‍යාපනික ජයග්‍රහණවල ආපසු හැරවිය නොහැකි පරිහානියක සැබෑ අනතුරක් තිබෙන අතර එය ඉදිරි පරම්පාරවන් සහ සමස්ත සමාජය මත බලපෑමක් ඇත කරවනු ඇත.

ශ්‍රී ලාංකිකයන් බහුතරයක් තම ජීවනෝපායයන් වෙනුවෙන් යැපෙන කෘෂිකාර්මික සහ ධීවර ක්ෂේත්‍ර ආණ්ඩුව තවදුරටත් නොසලකා හරියි.ජනතාවගේ ජීවනෝපායයන් තුළ සැලකිය යුතු ආයෝජන නොමැතිව පුරවැසියන් මත බර පැටවීම වේගවත් ඉඩම් අන්සතුකරණයේ බරපතල අවදානමකට ඔවුන් නිරාවරණය කරන අතර එය කෘෂිකාර්මික අංශය විශාල සමාගම් විසින් අත්පත් කරගනු ලැබීමට ඉඩ සලසනු ඇත.කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ආණ්ඩුවේ අයවැය යෝජනා මෙබඳු ප්‍රතිඵලයක් ඇති කිරීමේ අභිප්‍රාය සහිත බව පෙනී යයි.අයවැයේ සඳහන්ව තිබෙන ‘උරුමය’ වැඩසටහන කුඩා ගොවීන් ලක්ෂ 20 ට විකිණිය හැකි ඉඩම් ලබා දෙනු ඇති බව දක්වයි. ඉඩම් හිමිකම් හා ගොවි හිමිකම් ක්‍රියාකාරීන් අනතුරු අඟවා ඇති ආකාරයට, මෙහි යටි අරමුණ වන්නේ දැනටමත් ණය බරින් මිරිකී සිටින කුඩා ගොවීන්ට ඉඩම් සන්තකය අහිමි කරවීමයි.කුඩා ගොවීන්ට කෘෂිකර්මය වෙනුවෙන් තිරසාර සහාය දැඩිව අවශ්‍යව පවතී. අවසානයේ ණය හේතුවෙන් සිදුවන ඉඩම් සන්තකය අහිමි වීම ආහාර අනාරක්ෂිතතාව තවත් නරක අතට හරවනු ඇති අතර සමාජයේ සියළු කොටස් හා රට වෙනුවෙන් නැවත වෙනස් කළ නොහැකි දිගුකාලීන බලපෑම් ඇති කරවනු ඇත.

වර්තමානයේ බොහෝ කුටුම්භයන් දිනකට එක් ආහාර වේලකින් පමණක් ජීවත්වීම දිගින් දිගටම සිදු කරයි.කෙසේවෙතත්, මෙම තත්ත්වයේ බරපතලකම සම්බන්ධයෙන් දැනුවත්බවක් හෝ අයවැය පිළිබිඹු නොකරයි.ළමුන් අතර වැඩිවන මන්දපෝෂණය හෝ දිගින් දිගටම පවතින ආහාර අනාරක්ෂිතබව වැනි අභියෝගවලට විසඳුම් සැපයීම සඳහා කුමන හෝ සැලකිය යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් හෝ අයවැය මුදල් වෙන්කිරීමක් ආණ්ඩුව ඉදිරිපත් නොකරයි. 2022 දී වයස අවුරුදු පහට අඩු ළමුන්ගෙන් 42.9% ක් මන්දපෝෂණයෙන් පෙළුණු අතර 2023 මාර්තු වන විට මාස හයේ සිට මාස 59 අතර වයසේ ළමුන්ගෙන් 19.8% ක් මන්දපෝෂණයේ උග්‍ර තත්ත්වය වන ක්ෂය වීමෙන් පෙළෙමින් සිටියහ.2023 නොවැම්බර් වන විට අවුරුදු 12 සහ 13 වයස් කාණ්ඩයේ ළමුන් පාසලින් ගිලිහී යාම වැඩි වී තිබූ බවට පවුල් සෞඛ්‍ය කාර්යාංශය අනතුරු අඟවා තිබිණි.

පටු ඉලක්ක සහිත අස්වැසුම සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයෙන් රටේ දුප්පතුන් සහ අවිධිමත් ශ්‍රමිකයන් බොහොමයක් බැහැර කරනු ලබන බවට එකමුතුව මෙයට පෙර අනතුරු අඟවා තිබිණි. සුදුසුකම සම්බන්ධයෙන් සැකයක් තිබිය නොහැකි හා මෙයට පෙර සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් කරනු ලැබ සිටි පුද්ගලයන් ක්‍රම ක්‍රමයෙන් ඉවත් කිරීම අප අඛණ්ඩව නිරීක්ෂණය කර ඇත.වැඩසටහනට ඇතුළත් කරගෙන නොමැති තැනැත්තන් වෙනුවෙන් අභියාචනා ක්‍රියාවලිය ව්‍යාජ සහ පරිපාලනමය ප්‍රමාදයන්ගෙන් පීඩාවට පත් එකකි.අස්වැසුම වැඩසටහන පීඩාකාරී ජා.මූ.අ. න්‍යායපත්‍රයේ බලපෑමට වඩාත්ම ලක් වූ තැනැත්තන් වෙනුවෙන් ආරක්ෂක දැලක් සැපයීමෙන් ඉතා දුරස් වූ වැඩසටහනකි.එසේ තිබියදීත්, මෙම අයවැය මුදල් මාරුකිරීම පාදක කරගත් ඉලක්කගත සමාජ ආරක්ෂණය වෙනුවෙන් ද.දේ.නි.යෙන් හුදෙක් සියයට 0.6 ක් වන මුදල් වෙන් කිරීමක් සමඟ ජා.මූ.අ. අනිවාර්ය බවට නියම කරන ලද සමාජ ආරක්ෂණ "අවම සීමාවට" අනුකූල වීමට තවදුරටත් කටයුතු කරයි. සර්වජන සමාජ ආරක්ෂණය වෙනුවෙන් විශේෂඥ මතය හා ජනතා ඉල්ලීම නොසලකා හැරීම ආණ්ඩුව දිගින් දිගටම සිදු කරයි.

කොවිඩ්-19 අතරතුරදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැඩි වීම සහ මෙම ආර්ථික අර්බුදය අතරතුරදී එය දිගින් දිගටම වැඩි වීම යන ගැටළුවට අයවැය විසඳුම් සපයා නොමැත. කාන්තා හා ළමා අමාත්‍යාංශයේ අයවැය ඉදිරි වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබ තිබේ. ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩකරන කාන්තාවන් සහ ළමුන් වැඩිම බලපෑමට ලක්ව සිටින නමුත් අයවැය තුළ ඔවුනට කිසිදු සහනයක් සලසා නැත. මෙම සන්දර්භය තුළ, ආණ්ඩුව පැහැදිලිවම කාන්තා විරෝධී හා වැඩ කරන ජනතා විරෝධී අයවැයක් ඉදිරිපත් කර තිබියදී ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව වෙනුවෙන් නීති හඳුන්වාදීමට එය දරන උද්යෝගීමත් නොවන උත්සාහයන් අප තුළ පැහැදීමක් ඇති නොකරයි.

රටකට මෙම අර්බුදයෙන් ගොඩ ඒමට ප්‍රධාන මාර්ගයක් වන්නේ එහි ජනතාව තුළ ආයෝජනය කිරීමය යන්න හඳුනා ගැනීමට මෙම අයවැය අසමත්ය. වික්‍රමසිංහ- රාජපක්ෂ ආණ්ඩුවට සිය ජනතා විරෝධී ආර්ථික ගමන් මාර්ගය වෙනස් කිරීමට උනන්දුවක් නොමැති බව පැහැදිලිය. අප මෙරට වැඩ කරන ජනතාවට සහයෝගය දක්වන අතර ආණ්ඩුව සහ ජා.මූ.අ. විසින් නිර්දේශිත ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ වැඩසටහන විසින් ඔවුන්ගේ කර මත හෙළා ඇති බරැති වියගස සමඟ ඔවුන් එදිනෙදා දිවි රැක ගැනීමේ අරගලයේ නිරත වෙද්දී අප ඔවුන් සමඟ දුක බෙදා ගන්නෙමු. ආහාර අනාරක්ෂිත බවට විසඳුම් සැපයීම ප්‍රමුඛතාවක් විය යුතු බවටත් නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍යය ඇතුළුව සර්වජන සමාජ ආරක්ෂණය පොදුවේ සැපයීම වෙනුවෙන් අපගේ ඉල්ලීම් අපි යළි අවධාරණය කරන්නෙමු.

**ආර්ථික යුක්තිය වෙනුවෙන් ස්ත්‍රීවාදී එකමුතුව යනු ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථිකය තුළ ඔවුන් සමඟ වැඩකරන ප්‍රජාවන්ගේ සැබෑම අත්දැකීම් මත පදනම්ව ප්‍රතිපත්ති නිර්දේශ වටහා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ ප්‍රකාශ කිරීමට රටේ සියළු ප්‍රදේශවලින් *2022* අප්‍රේල් මස දී එක් වූ ස්ත්‍රීවාදී ආර්ථික විද්‍යාඥයන්*,* උගතුන්*,* ක්‍රියාකාරීන්*,* විශ්වවිද්‍යාල සිසුන් සහ නීතීඥයන් යන අයගේ එකමුතුවකි*.***

**කරුණාකර ඔබේ අදහස් මෙම විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න -**
***feministcollectiveforjustice@gmail.com***

***2023* නොවැම්බර් *28***